# විනෝද බදු ආඥාපනත

## 267 වන අධිකාරය

1998 අංක 62 දරන සීගිරිය උරුමය පදනම පනතෙන් අවසන් වරට කරන ලද සංශෝධනය දක්වා සංශෝධන ඇතුළත් කර ඇත

පොදු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

පහසු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

# විනෝද බදු ආඥාපනත

## පටුන


| වගන්තිය | විස්තරය | පිටුව |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය | 1 |
| 2. | විනෝද බද්ද නියම කිරීම | 1 |
| 3. | ගෙවීම් බද්දට යටත් බව | 1 |
| 4. | බදු කාර්යය සඳහා බදු ලේබල් නිකුත් කළ යුතු බව | 1 |
| 5. | විනෝද ප්‍රසංගවලට ඇතුළුවීම, ලේබලය අමුණන ලද ප්‍රවේශ පත්‍රයකින් ම විය යුතු බව | 2 |
| 6. | බද්ද අයකළ යුත්තේ හා ගෙවිය යුත්තේ කෙසේද යන බව | 2 |
| 7. | ඇතැම් අවස්ථාවල දී බද්ද අයකරන ආකාරය | 2 |
| 8. | බද්දෙන් නිදහස් කිරීම | 3 |
| 9. | සෙල්ලම්, ක්‍රීඩා ආදිය සම්බන්ධයෙන් බද්දෙන් නිදහස් කිරීම හෝ බදු අඩු කිරීම | 4 |
| 10. | විනෝද බදු හා දඩ පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවිය යුතු බව | 5 |
| 11. | නියෝග | 5 |
| 12. | විනෝද ප්‍රසංග ස්ථානයකට ඇතුළුවීමේ බලය | 6 |
| 13. | වැරදි සහ දඬුවම් | 6 |
| 14. | බදු ලේබලවල ව්‍යාජ අත්සන් දැමීම ආදිය | 7 |
| 15. | විනෝද ප්‍රසංගයේ හිමිකරුගෙන් විනෝද බද්ද අය කර ගැනීම | 7 |
| 16. | අර්ථ නිරූපණය | 7 |
| 17. | ඇතැම් විනෝද කටයුතු සඳහා මේ ආඥාපනත අදාළ නොවිය යුතු බව | 8 |
| | විනෝද බදු ආඥාපනතේ විධිවිධාන පිළිබඳ වාර්තාගත අධිකරණ වාර්තා | 10 |

පසු පරිශීලනය සඳහා පමණි - ගාමිණී ගුණසේකර

# විනෝද බදු

## (267 වන අධිකාරය)

**පළාත් පාලන ආයතනවල පරිපාලන සීමාව ඇතුළත පැවැත්වෙන පොදු විනෝද ප්‍රසංගවලට ඇතුළුකර ගැනීමේදී අයකරනු ලබන මුදල් සම්බන්ධයෙන් බද්දක් නියම කිරීමට හා අය කිරීමට ඒ පළාත් පාලන ආයතනවලට බලය ලබාදෙන ආඥාපනතකි.**

1946 අංක 12 දරන ආඥාපනත
1947 අංක 43 දරන ආඥාපනත,
1952 අංක 2,
1961 අංක 45,
1984 අංක 37,
දරන පනත්,

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**1**. මෙම ආඥාපනත විනෝද බදු ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් නියම කළ හැකි දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. [1]

විනෝද බද්ද නියම කිරීම.

**2.** (1) පළාත් පාලන ආයතනයක් විසින් යෝජනා සම්මතයක් මඟින් තීරණය කරනු ලබන ප්‍රමාණයක හෝ ප්‍රමාණ අනුව, ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමාව ඇතුළත පැවැත්වෙන විනෝද ප්‍රසංගවලට ඇතුළුකර ගැනීමේ දී අයකරනු ලබන මුදලින් (මෙහි මින් මතු "විනෝද බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, නියම කිරීමට හා අයකර ගැනීමට සෑම පළාත් පාලන ආයතනයකට ම බලය තිබිය යුතු ය. [2]

ඇතුළුකර ගැනීම සඳහා අයකරනු ලබන එකිනෙකට වෙනස් ගාස්තු සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් ප්‍රමාණයේ මුදලක් අයකර ගැනීමට හැකි වන පරිදි විනෝද බද්ද නියම කළ හැකි ය. එසේ වුව ද, ඒ කවර අවස්ථාවක දී හෝ අයකරනු ලබන විනෝද බදු ප්‍රමාණය ඇතුළුකරගැනීමට අයකරනු ලබන ගාස්තුවෙන් සියයට පහකට නොඅඩු හා සියයට විසිපහකට නොවැඩි විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම යෝජනාවක් ම අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට අමාත්‍යවරයා විසින් ඒ යෝජනාව අනුමත කරනු ලැබුවහොත් ඒ බව ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුවාත් හැර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ ඒ යෝජනාවේ නිශ්චිතව සඳහන් කර ඇති පසුව එළඹෙන දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය.

ගෙවීම් බද්දට යටත් බව.

**3**. විනෝද බද්දක් නියම කිරීමේ යෝජනාවක් යම් ප්‍රදේශයක වලංගුව පවතින අවස්ථාවක, 8 වන වගන්තියේ හෝ 9 වන වගන්තියේ පටහැනිව කිසිවක් වන්නේ නම් මිස, මේ ආඥාපනත අදාළ වන්නා වූ හා ඒ ප්‍රදේශයේ පැවැත්වෙන්නා වූ කවර හෝ විනෝද ප්‍රසංගයකට වුව ද ඇතුළුකිරීම සඳහා කරනු ලබන සෑම ගෙවීමක් ම, නියම කරන ලද විනෝද බද්දට යටත් විය යුතු ය.

බදු කාර්යය සඳහා බදු ලේබල් නිකුත් කළ යුතු බව.

**4.** (1) විනෝද බද්ද අයකිරීමේ හා ගෙවීමේ කටයුතු සඳහා විනෝද බද්ද නියම කර ඇති සෑම පළාත් පාලන ආයතනයකම නිසි නිලධාරියා විසින්, "බදු ලේබල" යනුවෙන් නම් කරනු ලබන ලේබල නිකුත් කළ යුතු ය. එක් එක් බදු ලේබලයක් එහි සඳහන් ව ඇති

පටුන

[1] 1947 ජනවාරි මස 01 වන දින සිට මේ ආඥාපනත ක්‍රියාත්මක වේ.

[2] විනෝද බද්ද නියම කිරීමේ යෝජනා සම්මතය නියමිත පටිපාටියට අනුව කරනු ලැබිය යුතු බව සහ ඒ සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ද පටිපාටියට ම අනුව කළ යුතු බවට තීරණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද අධිකරණ තීරණයේ වාර්තා ගත තීරණය මේ ලේඛනය අවසානයේ දක්වා ඇත.

වටිනාකමින් යුක්ත විය යුතු අතර, ඒ පළාත් පාලන ආයතනයේ නාමය ද, නිසි නිලධාරියාගේ අත්සනෙහි සටහනක් ද එහි තිබිය යුතු ය:-

(2) (අ) විනෝද ප්‍රසංගයක අයිතිකරු නොවන කිසිම තැනැත්තකුට; හෝ

(ආ) විනෝද ප්‍රසංගයක අයිතිකරුට වුව ද ලේබලයේ වටිනාකම ඒ අයිතිකරු විසින් ගෙවනු නොලැබුවහොත්; හෝ

කවර හෝ පළාත් පාලන ආයතනයක නිසි නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ කිසිම බදු ලේබලයක් නිකුත් නොකළ යුතු ය.

විනෝද ප්‍රසංගවලට ඇතුළුවීම, ලේබලය අමුණන ලද ප්‍රවේශ පත්‍රයකින් ම විය යුතු බව.

**5.** (1) විනෝද බද්ද නියම කර ඇති පළාත් පාලන ආයතනයේ නිසි නිධාරියා විසින් 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද්දා වූ ද, ඇතුළුවීමේ ගාස්තුව වෙනුවෙන් අය කළ හැකි බදු ප්‍රමාණයට වටිනාකමින් සමාන වූ ද, පාවිච්චි නොකළ බදු ලේබලයක් හෝ බදු ලේබල අමුණා ඇති ප්‍රවේශ පත්‍රයක් නොමැති ව, විනෝද බද්දට යටත් වූ ඇතුළුවීමේ ගාස්තු ඇති කවර හෝ විනෝද ප්‍රසංගයකට වුව ද කවර හෝ තැනැත්තකු ඇතුළුකර නොගත යුතු ය.

(2) ඇතුළුවීමේ ගාස්තුව විනෝද බද්දට යටත් වන්නා වූ කවර හෝ විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් වුව ද, ඒ විනෝද ප්‍රසංගයේ ඇතුළුවීමේ ගාස්තු පිළිබඳ වාර්තා සැපයීමට විනෝද ප්‍රසංගයේ හිමිකාරයා පිළියෙල කොට තිබේ නම්, එසේ ම, යථෝක්ත විනෝද බද්ද නියම කළ පළාත් පාලන ආයතනයේ නිසි නිලධාරියා විසින් එම වැඩ පිළිවෙල අනුමත කොට තිබේ නම්, තව ද, ඒ බද්ද ගෙවන ලෙස නිසි නිලධාරියා විසින් අනුමත කර ඇති ආකාරයකින් හා මුදල් ප්‍රමාණයකින් ඇපයක් තබා තිබේ නම්, එබඳු විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

බද්ද අයකළ යුත්තේ හා ගෙවිය යුත්තේ කෙසේද යන බව.

**6.** බද්දට යටත් වූ ඇතුළුවීමේ ගාස්තුවක් සම්බන්ධයෙන් අය විය යුතු විනෝද බද්ද, එබඳු ඇතුළුවීමක් සම්බන්ධයෙන් 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේ නම්, ඒ උපවගන්තියේ විධිවිධාන අදාළ වන පරිදි ප්‍රවේශ පත්‍රයක ඇමුණු පාවිච්චි නොකළ ලේබලයක හෝ ලේබලවල මාර්ගයෙන් ගෙවිය හැකි ය. එසේ ම ඒ උපවගන්තියේ විධිවිධාන ඒ ආකාරයෙන් අදාළ නොවන්නේ නම්, ඇතුළුවීමේ සංඛ්‍යාව ගණන් බලා ඒ අනුව විනෝද බද්ද ගෙවිය හැකි ය. එහෙත් ඒ බද්ද එපරිද්දෙන් අය නොකරන ලද්දේ නම් හෝ නොගෙවන ලද නම්, විනෝද ප්‍රසංගයේ අයිතිකරුට එරෙහිව මේ ආඥාපනත යටතේ කවර හෝ වරදකට පැවරිය හැකි නඩුවකට හානියක් නොවන පරිදි, සිවිල් නඩුවක් පවරා ඒ මුදල ඒ අයිතිකරුගෙන් අයකර ගැනීමට බද්ද නියම කළ පළාත් පාලන ආයතනයට හැකි ය.

8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කිසියම් විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් නිසි නිලධාරියා වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඒ විනෝද ප්‍රසංගයෙන් අයවිය යුතු සේ සැලකෙන කිසියම් බද්දක් අයකර ගැනීම සඳහා පවරන කිසිම නඩුවක් පූර්වෝක්ත විනෝද ප්‍රසංගය පැවැත් වූ දින සිට දින තිහක් ඉක්මවා ඇත්තේ නම් මිස, නොපැවරිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී බද්ද අයකරන ආකාරය.

**7.** කිසියම් විනෝද ප්‍රසංගයකට ඇතුළුවීම සඳහා අයකරනු ලබන ගෙවීමක්, කිසියම් සමාජයක, සංගමයක හෝ සමිතියක ග්‍රාහක මුදල් වශයෙන් හෝ පරිත්‍යාග මුදල් වශයෙන් හෝ සාමයික ප්‍රවේශ පත්‍රයක් සඳහා හෝ විනෝද ප්‍රසංග ගණනාවකටම ඇතුළුවීමට නැතහොත් කිසියම් විනෝද ප්‍රසංගයකට කිසියම් කාලසීමාවක දී ඇතුළුවීමට බලය ලබා

පටුන

ගැනීම් වශයෙන් හෝ මුදල් බණ්ඩයක් වශයෙන් එක් වරම ගෙවන අවස්ථාවක දී, ඒ මුදල් බණ්ඩය වෙනුවෙන් ම විනෝද බද්ද ගෙවිය යුතු ය. එහෙත් මුදල් බණ්ඩයකින් කරන ලද ගෙවීමක් හෝ ප්‍රවේශ පත්‍රයක් සඳහා කරන ලද කවර ගෙවීමක් වුව ද විනෝද ප්‍රසංගයකට ඇතුළුවීමේ ගාස්තුව වශයෙන් ම පමණක් නොව ඊට අතිරේක වශයන් වෙනත් බලතල, අයිතිවාසිකම් හෝ කාර්යය සඳහා ද කරන ලද ගෙවීමක් වශයෙන් සැලකිය හැකි බව හෝ ඇතුළුවීමේ ගාස්තු විනෝද බද්දට යටත් නොවන විනෝද ප්‍රසංගයකට ඇතුළුවීමේ ගාස්තුවලින් හෝ විනෝද බදු වලංගු වී නොමැති කිසියම් කාල සීමාවක් ඇතුළත දී අයකරන ලද ඇතුළුවීමේ ගාස්තුවලින් පූර්වෝක්ත මුදල සමන්විත වී ඇති බව, යථෝක්ත බද්ද නියම කළ පළාත් පාලන ආයතනයට හැඟී යන යම් අවස්ථාවක දී, බද්ද අය කළ යුතු විනෝද ප්‍රසංගවලට ඇතුළුවීමේ අයිතිවාසිකම් සඳහා ගෙවා ඇති මුදල් ප්‍රමාණය වශයෙන් ඒ පළාත් පාලන ආයතනයට හැඟෙන මුදල වෙනුවෙන් පමණක් බද්ද අය කරනු ලැබිය හැකි ය.

**8**. (1) පහත සඳහන් ආකාරයේ විනෝද ප්‍රසංගයකට ඇතුළුවීම සඳහා කරනු ලබන සෑම ගෙවීමක් ම විනෝද බද්දෙන් නිදහස් වන්නේ ය. එසේ ම ඊට යටත් නොවන්නේ ය:- බද්දෙන් නිදහස් කිරීම.

(අ) යම් විනෝද ප්‍රසංගයකින් ලැබෙන දළ ආදායම හෝ ශුද්ධ ආදායම හෝ නියෝග මගින් නියම කළ හැකි කිසියම් පොදු ආගමික, අධ්‍යාපනික, පරිත්‍යාගමය හෝ පුණ්‍යමය කටයුත්තක් හේ කටයුතු වෙනුවෙන් සම්පූර්ණයෙන් ම යොදනු ලබන්නේ නම්; හා

(ආ) විනෝද ප්‍රසංගය පවත්වන දිනයට දින තුනකට ප්‍රථම ඒ විනෝද ප්‍රසංගයේ අයිතිකරු විසින් ඒ විනෝද ප්‍රසංගයේ දළ ආදායම හෝ ශුද්ධ ආදායම කවර හෝ එබඳු කටයුත්තක් හෝ කටයුතු සඳහා යොදවන බවට නියමිත ආකෘතියට අනුරූප වූ ප්‍රකාශයක් යථෝක්ත විනෝද බද්ද නියම කළ පළාත් පාලන ආයතනයේ නිසි නිලධාරියා වෙත ඉදිරිපත් කර ඇති විටෙක වේ.

තව ද, ඒ ප්‍රකාශයේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව දැක්වෙන ප්‍රකාශයකින් ඒ සෑම ප්‍රකාශයක් ම සහතික කළ යුතු ය.

මේ උපවගන්තියේ "ශුද්ධ ආදායම" යන්නෙන්, විනෝද ප්‍රසංගය සඳහා සත්‍ය වශයෙන් වියදම් වූ මුදල දළ ආදායමෙන් අඩු කළ විට ඉතිරිවන මුදල හා දළ ආදායමෙන් සියයට හතළිහකට සමාන වූ මුදල යන දෙකෙන් අඩු මුදල අදහස් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ විනෝද බද්දෙන් නිදහස ලැබූ කවර හෝ විනෝද ප්‍රසංගයකින් වුව ද, ලැබුණු ආදායම ගෙවනු ලැබූ පුද්ගලයන් විස්තර කෙරෙන්නා වූ ප්‍රකාශයක්, ඒ ගෙවීම සම්බන්ධයෙන් ලබා ගන්නා ලද කුවිතාන්සිය ද සමග, යථෝක්ත විනෝද ප්‍රසංගය පැවැත් වූ දිනයේ සිට දින තිහක් ඇතුළත නිසි නිලධාරියා වෙත භාර දීම ඒ විනෝද ප්‍රසංගයේ අයිතිකරුගේ යුතුකම වන්නේ ය.

(2අ) කිසියම් විනෝද සංදර්ශනයක රඟ දක්වන්නන් සියළුම දෙනා ආධුනිකයන් බවට, ඒ විනෝද සංදර්ශනය පවත්වනු ලබන්නේ - [§ 2, 1961 අංක 45]

(අ) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත වන විට, ලංකා කලා මණ්ඩල පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ ලංකා කලා මණ්ඩලයේ සභාපතිවරයා විසින් ද; නැතහොත්

පටුන

(ආ) වෙනත් යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත් වන විට, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ද; [3]

ඒ විනෝද සංදර්ශනයේ අයිතිකරුට නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇත්තේ නම් සහ ඒ අයිතිකරු විසින් එබඳු ප්‍රසංගයක පළමු රඟ දැක්වීමේ දිනට දින තුනකට නොඅඩු දින ගණනකට පෙර විනෝද බදු අය කිරීමට යටත් වන එම රඟ දැක්වීම සිදු කරන පළාත් පාලන ආයතනයේ නිසි නිලධාරියා වෙත ඒ සහතිකය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම්, ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ කෙරෙන පළමු රඟ දැක්වීම් දහය සඳහා වන ඇතුළත් කර ගැනීමේ ගාස්තු විනෝද බද්දෙන් නිදහස් විය යුතු අතර, විනෝද බද්දට යටත් නොවිය යුතු ය.

(3) මේ ආඥාපනත යටතේ කෙරෙන කිසියම් නඩු පැවරීමක දී හෝ මේ ආඥාපනත යටතේ අයවිය යුතු කිසියම් බද්දක් අයකර ගැනීමට පවරන ලද කිසියම් නඩුවක දී, ඇතුළුවීම සඳහා ගෙවන ලද යම් කිසි ගාස්තුවක් (1) වන උපවගන්තිය යටතේ හෝ (2අ) වන උපවගන්තිය යටතේ බද්දෙන් නිදහස් කරන ලදැයි යම් තැනැත්තකු කියා සිටින්නේ නම්, ඒ ගාස්තු බද්දෙන් නිදහස් කරනු ලැබූ බව ඔප්පු කිරීමේ භාරය, එසේ කියා සිටින තැනැත්තා සතු ව පැවතිය යුතු ය. [§ 2, 1961 අංක 45]

සෙල්ලම්, ක්‍රීඩා ආදිය සම්බන්ධයෙන් බද්දෙන් නිදහස් කිරීම හෝ බදු අඩු කිරීම.

**9.** (1) සෙල්ලමක්, ක්‍රීඩාවක් හෝ ව්‍යායාම තරඟයක් වන්නා වූ යම් විනෝද ප්‍රසංගයකින් ලැබෙන දළ ආදායම හෝ ශුද්ධ ආදායම සම්පූර්ණ වශයෙන් ම සෙල්ලම්, ක්‍රීඩා හෝ ව්‍යායාම කටයුතුවලට අනුබල දීම සඳහා හෝ ඒවා දියුණු කරලීම සඳහා යොදවනු ලබන්නේ නම්, එබඳු කවර විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් වුව ද, මේ වගන්තිය අදාළ වන්නේ ය.

එසේ වුව ද, කවර තුරඟ තරඟයක් සම්බන්ධයෙන් වුව ද මේ වගන්තිය අදාළ නොවන්නේ ය.

(2) (අ) මේ වගන්තිය අදාළ වන්නා වූ විනෝද ප්‍රසංග පිළිබඳ ඇතුළුවීමේ ගාස්තු, කිසියම් පළාත් පාලන ආයතනයකින් නියම කර ඇති විනෝද බද්දෙන් නිදහස් විය යුතු යයි; හෝ

(ආ) ඇතුළුවීමේ එබඳු ගාස්තු වෙනුවෙන්, සෙසු විනෝද ප්‍රසංග විෂයෙහි ලා ඒ පළාත් පාලන ආයතනය මගින් නියම කර ඇති හා අය කරනු ලබන්නා වූ ප්‍රමාණයට වඩා අඩු වූ බදු ප්‍රමාණයක් අය කළ යුතු යයි; හෝ

යටත් විය යුතු කොන්දේසි හා නිදහස් කිරීම් ඇතහොත් ඒවා ද, සඳහන් කරනු ලැබූ යෝජනාවක් සම්මත කිරීමට පළාත් පාලන ආයතනයකට හැකි ය.

(3) මේ වගන්තිය අදාළ වන්නා වූ කිසියම් විනෝද ප්‍රසංගයක් පැවැත්වෙන දිනයට දින තුනකට ප්‍රථමයෙන් ඒ විනෝද ප්‍රසංගයේ දළ ආදායම් හෝ ශුද්ධ ආදායම යොදවන්නට අදහස් කරන කටයුත්ත විස්තර කෙරෙන ප්‍රකාශයක් ඒ විනෝද ප්‍රසංගයේ අයිතිකරු විසින් යථොක්ත බද්ද නියම කළ පළාත් පාලන ආයතනයේ නිසි නිලධාරියා වෙත ඉදිරිපත් නොකරනු ලැබුවහොත්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද යෝජනාවකින් ලැබෙන බදු නිදහස හෝ එහි ම සඳහන් වී ඇති අඩු බදු ප්‍රමාණය, ඉහතින් කී විනෝද ප්‍රසංගය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

පටුන

[3] 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත අනුව, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙනුවෙන් මේ සහතිකය නිකුත් කිරීමට අදාළ ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත.

තව ද, එබඳු ප්‍රකාශයක සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව දැක්වෙන ප්‍රකාශයකින් එබඳු සෑම ප්‍රකාශයක් ම ස්ථිර කළ යුතු ය.

(4) 8 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල, එහි (1) වන උපවගන්තියෙන් බදු නිදහස් කළ ප්‍රසංගයක් සඳහා කර තිබෙන සඳහන් කිරීම්, මේ වගන්තියේ සඳහන් යෝජනාවකින් නිදහස් කරන ලද ප්‍රසංගයකට නැතහොත්, අවශ්‍ය පරිදි එබඳු යෝජනාවකින් අඩු බදු ගෙවන ප්‍රසංගයකට අදාළ වන්නේ යම් සේ ද, ඒ 8 වන වගන්තියේ (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධාන මේ වගන්තිය අදාළ වන ප්‍රසංග සම්බන්ධයෙන් ද ඒ ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

(5) 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ශුද්ධ ආදායම" යන්නට දී ඇති අර්ථය ම මේ වගන්තිය සම්බන්ධයෙන් ද අදාළ වන සේ සැලකිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කරනු ලබන කවර හෝ යෝජනාවක් වුව ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ සිට වලංගු විය යුතු අතර, 2 වන වගන්තිය යටතේ සම්මත කරන ලද යෝජනාවක කුමක් සඳහන් ව තිබුන ද, මේ වගන්තිය යටතේ සම්මත කරන ලද යෝජනාව බල පැවැත්විය යුතු ය.

විනෝද බදු හා දඩ පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවිය යුතු බව.

**10**. පහත දැක්වෙන මුදල් පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවිය යුතු ය:-

(අ) මේ ආඥාපනත යටතේ ඒ පළාත් පාලන ආයතනය විසින් අයකරනු ලබන විනෝද බද්ද;

(ආ) ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමා ඇතුළත පවත්වන ලද කිසියම් විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ අධිකරණයක් මගින් අයකර ගනු ලබන විනෝද බද්ද; සහ

(ඇ) මේ ආඥපනත යටතේ ඒ පරිපාලන සීමා ඇතුළත කරන ලද වැරදි සම්බන්ධයෙන් අධිකරණයක් විසින් අය කරනු ලබන සියලුම දඩ මුදල්.

නියෝග.

**11**. (1) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කරවීමේ හෝ වලංගු කරවීමේ කාර්යය සඳහා නියෝග සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය. [4]

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, පහත සඳහන් යම් කාරණයක් හෝ කාරණා සියල්ල ම හෝ සම්බන්ධයෙන් නැතහොත් ඒ සඳහා නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකි ය:-

(අ) නියම කළ යුතු යයි මේ ආඥාපනතෙන් ප්‍රකාශකොට ඇති හෝ නියම වී ඇති සියලුම කාරණා;

(ආ) ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම හා ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර;

(ඇ) එක් අයෙකුට වැඩි වූ තැනැත්තන්ගේ ඇතුළුවීම සඳහා යොදනු ලබන ප්‍රවේශ පත්‍ර හා ඒවා සම්බන්ධයෙන් බද්ද ගණන් බැලීම;

(ඈ) 7 වන වගන්තියේ සඳහන් අවස්ථාවල දී අය කළ යුතු බදු ප්‍රමාණය තීරණය කිරීම;

පටුන

[4] 1947 පෙබරවාරි මස 26 වන දිනැති අංක 9,627 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති 1947 විනෝද බදු නියෝග.

ප්‍රජා පරිපාලන සේවා ප්‍රමිතිකරණ - ප්‍රජා ජ්‍ය්‍යාශයේ ශ්‍රේණිස්

(ඉ) විනෝද ප්‍රසංග ස්ථානයක එක් කොටසක සිට තවත් කොටසකට මාරු කිරීමේ දී බද්ද ගෙවීම;

(ඊ) ප්‍රවේශ පතුවල බදු ලේබල අනිවාර්යයෙන් ම ඇමිණීම හා බදු ලේබල විකෘති කිරීම හා ලකුණු කිරීම;

(උ) නිසි නිලධාරියා විසින් හෝ ඔහු වෙනුවෙන් විභාග කර බැලීමේ කටයුතු සඳහා පාවිච්චි කරන ලද ප්‍රවේශ පත්‍ර හෝ ඒවායේ කොටස්, අයිතිකරුවන් විසින් අනිවාර්යයෙන් ම තමන් වෙත රඳවා ගැනීම;

(ඌ) අත් වැරද්දෙන් විනාශ වූ හෝ විකෘති වූ, පාවිච්චි නොකරන ලද බදු ලේබලයක් හෝ ලේබල ආපසු දීම හා ඒවායේ මිල ආපසු ගෙවීම;

(එ) මේ ආඥාපනතතේ කටයුතු සඳහා තැබිය යුතු ලේඛන හා පොත්, ඒ ලේඛනවල හා පොත්වල ආකෘති, ඒවායේ ඇතුළත් කළ යුතු කරුණු සහ මේ ආඥාපනතේ කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ සියලුම වාර්තාවල හා ප්‍රකාශවල ආකෘති;

(ඒ) මේ උපවගන්තියේ විශේයෙන් සඳහන් කර ඇති කරුණු හෝ අනපේක්ෂිත හෝ සම්බන්ධ වූ කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය සම්මත කළ යුතු ය යන යෝජනාවක මාර්ගයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි යෝජනාවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසු හා ඒ පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ සෑම නියෝගයක් ම, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව, මේ ආඥාපනතේ ම පනවන ලද්දක් වශයෙන් වලංගුව ක්‍රියාත්මක විය යුතු ය.

විනෝද ප්‍රසංග ස්ථානයකට ඇතුළුවීමේ බලය.

**12**. කිසියම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි ස්ථානයක විනෝද ප්‍රසංගයක් පැවැත්වෙන අවස්ථාවක දී, විනෝද බද්ද නියම කර ඇති සෑම පළාත් පාලන ආයතනයක නිසි නිලධාරියකුට හෝ ඒ සම්බන්ධයෙන් ඒ පළාත් පාලන ආයතනය විසින් බලය දෙන ලද ඒ පළාත් පාලන ආයතනයේ කවර හෝ නිලධරයකුට හෝ ඒ ස්ථානයකට ඇතුළුවීමට බලය තිබිය යුතු ය. නැතහොත්, මේ ආඥාපනතේ විධිවිධානවලට හෝ මේ ආඥාපනත යටතේ සම්පාදිත කිසියම් නියෝගයක විධිවිධානවලට හෝ අනුකූල ව කටයුතු කරන්නේදැයි නිසැකව ම දැන ගැනීම සඳහා ඉහත කී යම් ස්ථානයක් වූ ද, සාමාන්‍ය වශයෙන් විනෝද ස්ථානයක් වශයෙන් පැවැත්වෙන්නා වූ ද කවර හෝ ස්ථානයකට වුව ද කුමන හෝ සැහෙන වේලාවක දී හෝ ඇතුළුවීමට ද ඒ යම් නිලධාරියකුට බලය තිබිය යුතු ය.

වැරදි සහ දඬුවම.

**13**. (1) 5 වන වගන්තියේ ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩවන ආකාරයෙන් කිසියම් තැනැත්තකු කිසියම් විනෝද ප්‍රසංග ස්ථානයකට ඇතුළුකරගනු ලැබුවහොත් ඒ විනෝද ප්‍රසංගයේ අයිතිකරු වරදකට වරදකරු විය යුතු ය.

කිසියම් විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ හෝ නිසි නිලධරයා වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති කිසියම් අවස්ථාවක දී, ඒ විනෝද ප්‍රසංගය සම්බන්ධයෙන් මේ උපවගන්තිය යටතේ කරන ලදැයි සලකනු ලබන කවර හෝ වරදක්

පිළිබඳව වුව ද කිසිම නඩු පැවරීමක්, එම විනෝද ප්‍රසංගය පැවැත් වූ දිනයේ සිට දින තිහකට මත්තෙන් නොකළ යුතු ය.

(2) කිසියම් තැනැත්තෙක්-

(අ) මේ ආඥාපනතේ විධිවිධානයන් හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද කිසියම් නියෝගයක විධිවිධාන කඩකරන්නේ නම්; හෝ

(ආ) 12 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කිරීමේ දී පළාත් පාලන ආයතනයක කිසියම් නිලධරයකුට බාධා කරන්නේ නම්;

ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු ය.

(3) මේ ආඥාපනත යටතේ (14 වන වගන්තිය යටතේ ගැනෙන වරදක් නොවන්නා වූ) වරදක් කරන කවර තැනැත්තකු වුව ද මහේස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන විභාගයක දී වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

**14**. විනෝද බද්ද නියම කරන ලද පළාත් පාලන ආයතනයක නිසි නිලධරයකු විසින් නිකුත් කරන ලදැයි සලකනු ලබන කිසියම් බදු ලේබලයක ව්‍යාජ අත්සන් තබන්නා වූ හෝ එබඳු ලේබලයක් පාවිච්චි කරන්නා වූ, විකුණන්නා වූ, විකිණීමට දෙන්නා වූ, වෙනත් යම් ආකාරයකින් නිදහස් කරන්නා වූ හෝ එබඳු ලේබලයක් ව්‍යාජ බව දැන දැන ම හෝ එය එසේ බව විශ්වාස කිරීමට හේතු ඇති ව එබඳු ලේබල ස්වකීය සන්තකයේ තබාගන්නා වූ කවර තැනැත්තකු වුව ද, වරදකට වරදකරු විය යුතු අතර, වසර දෙකකට නොවැඩි දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමේ දඬුවමකට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ දණ්ඩනය යන දෙකට ම හෝ යටත් විය යුතු ය. බදු ලේබලවල ව්‍යාජ අත්සන් දැමීම ආදිය.

**15**. 5 වන වගන්තියේ විධිවිධාන කඩවන ආකාරයෙන් විනෝද ප්‍රසංගයකට කිසියම් තැනැත්තකු ඇතුළුකර ගැනීමේ හේතුවෙන්, මේ ආඥාපනත යටතේ කරන ලද වරදකට එම විනෝද ප්‍රසංගයේ අයිතිකරු කිසියම් අධිකරණයක් විසින් වරදකරු කර ඇති අවස්ථාවක දී, එබඳු විනෝද ප්‍රසංගයකට ඇතුළුකර ගැනීමේ දී ගෙවිය යුතු ව තිබුණු කිසියම් විනෝද බද්දක්, 6 වන වගන්තියේ සඳහන් ආකාරයට ඒ වන විටත් අයකර ගෙන නොමැති අවස්ථාවක, ඒ මුදල ඒ බද්ද නියම කළ පළාත් පාලන ආයතනයේ නිසි නිලධරයා විසින් යථොක්ත අධිකරණයට සහතික කොට දක්වා සිටිය යුතු ය. එසේ වූ විට, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අයකර ගන්නා ආකාරයට එම මුදල අධිකරණය විසින් අයකර ගත යුතු ය. විනෝද ප්‍රසංගයේ හිමිකරුගෙන් විනෝද බද්ද අය කර ගැනීම.

**16**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ ආඥාපනතේ- අර්ථ නිරූපණය.

"ඇතුළුකර ගැනීම" යන්නෙන්, විනෝද ප්‍රසංගයක් සම්බන්ධයෙන් යෙදෙන විට, නරඹන්නෙකු වශයෙන් නැතහොත් නරඹන පිරිසෙන් කෙනෙකු වශයෙන් විනෝද ප්‍රසංගයකට ඇතුළුකර ගැනීම අදහස් වන අතර, ඒ විනෝද ප්‍රසංගය පැවැත්වෙන කවර ස්ථානයකට වුව ද ඇතුළු කර ගැනීමත් ඊට ඇතුළත් විය යුතු ය. එසේ ම, එහි ව්‍යාකරණ වෙනස්කම් හා සමාන පාඨ ද ඒ ආකාරයෙන් තේරුම් ගත යුතු ය;

"චිත්‍රපට විනෝද ප්‍රසංගය" යන්නෙන්, යාන්ත්‍රික ශබ්ද නිෂ්පාදනය සහිත වූ හෝ රහිත වූ චිත්‍රපට යන්ත්‍රයක නැතහොත් සෙසු එබඳු යන්ත්‍රයක මාර්ගයෙන් කරනු ලබන

පටුන

පාදු පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

චිත්‍රපට ප්‍රදර්ශනයක් හෝ සෙසු දෘෂ්ටිමය අලංකාර උපක්‍රම ප්‍රදර්ශනයක් අදහස් වේ;

“මේ ආඥාපනත අදාළ වන විනෝද කටයුතු” යන්නෙන්, ගෙවීම් කරනු ලැබූ විට තැනැත්තන් ඇතුළත් කරගනු ලබන යම් නැටුමක්, තරඟ ක්‍රීඩාවක්, ක්‍රීඩාවක්, සිනමා දර්ශන විනෝදවීමක්, සංදර්ශනයක්, ගායනයක්, සර්කස් දර්ශනයක් හෝ විවිධ ප්‍රසංගයක් අදහස් වන අතර, ඊට වේදිකා නාට්‍යයක්, නෘත්‍ය, රූකඩ, මුද්‍රා නාට්‍ය, සහ වේදිකා මත කෙරෙන සමාන ස්වභාවයේ වූ වෙනත් රංගනයක් ඇතුළත් නොවේ; [§ 2, 1984 අංක 37]

“පළාත් පාලන ආයතනය” යන්නෙන්, කවර හෝ මහා නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වේ;

“ඇතුළුවීම සඳහා ගෙවීම” යන්නෙන්, විනෝද ප්‍රසංග ස්ථානයක එක කොටසකට ඇතුළු වූ තැනැත්තකු විනෝද බද්ද අදාළ වන්නා වූ හෝ වැඩිපුර බදු අවශ්‍ය වන්නා වූ හෝ ගෙවීමක් කර එහි ම වෙනත් කොටසකට පසුව ඇතුළුවීමේ දී, එසේ ගෙවූ ගාස්තුව ද ඇතුළත් විය යුතු ය. එසේ ම, එහි ව්‍යාකරණ වෙනස්කම් හා සමාන පාඨ ද ඒ ආකාරයෙන් තේරුම් ගත යුතු ය;

“නිසි නිලධරයා” යන්නෙන්-

(අ) මහා නගර සභාවක් සම්බන්ධයෙන් වන විට, ඒ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ද;

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වන විට, ඒ නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද;

“අයිතිකරු” යන්නෙන්, යම් විනෝද ප්‍රසංගයක් හෝ සංදර්ශනයක් සම්බන්ධයෙන් වන විට, එහි කළමනාකාරිත්වය පිළිබඳ ව වගකිව යුතු තැනැත්තා ද;

“බදු ලේබල්” යන්නෙන්, විනෝද බදු නියම කරනු ලබන යම් පළාත් පාලන ආයතනයක නිසි නිලධාරියා විසින් විනෝද බදු කාර්යයන් සඳහා නිකුත් කරනු ලබන බදු ලේබල් ද;

“වේදිකා රංගනය” යන්නෙන්, යම් ශෝකාන්ත නාට්‍යයක්, සුඛාන්ත නැතහොත් හාස්‍යජනක නාට්‍යයක්, ප්‍රහසනයක්, ගීත නාටකයක්, උද්වේගකර නාට්‍ය, මුද්‍රා නාට්‍ය නැතහොත් අභිරූපණ, හෝ වේදිකාවක රඟ දක්වනු ලබන විනෝද කටයුතු හෝ ඒවායෙහි කොටස්;

අදහස් විය යුතු ය.

ඇතැම් විනෝද කටයුතු සඳහා මේ ආඥාපනත අදාළ නොවිය යුතු බව.

**17**. කිසියම් සංගමයක් හෝ ආයතනයක් මගින් සලස්වනු ලබන හා ලාභයක් ලැබීමේ අදහසින් පවත්වනු නොලබන (මේ කාරණය සම්බන්ධයෙන් පැන නගින යම් ප්‍රශ්නයක් වේ නම්, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය) සහ ඇතුළත් කරගැනීම තනිකරම සන්නද්ධ සේවාවන්හි සාමාජිකයන්ට හා ඔවුන්ගේ භාර්යාවන්ට සහ දරුවන්ට පමණක් සීමා කෙරෙන යම්

විනෝද සංදර්ශනයකට මේ ආඥාපනත අදාළ නොවිය යුතු අතර, එසේ අදාළ වේ යයි සලකීම හෝ තේරුම් ගැනීම හෝ නොකළ යුතු ය. [5]

පොදු පරිශීලනය සඳහා පමණි. - ගාමිණී ගුණසේකර

[5] 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 11 වන වගන්තිය සහ 1998 අංක 62 දරන සීගිරිය උරුමය පදනම පනතේ 16 වන වගන්තිය මගින් අදාළ අරමුදල් සඳහා දායකත්වය වෙනුවෙන් පවත්වන විනෝද කටයුතු වෙනුවෙන් මේ පනත අදාළ නොවන බව දැක්වේ.

විනෝද බදු ආඥාපනතට අදාළ ව ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් දෙනු ලැබ වාර්තාගත තීරණ

## 1. Jaffna Municipal Council v. Perumaiyinar - NLR - 327 of 66 [1955] LKCA 52; (1955) 66 NLR 327 (24 February 1955)

**327**

**1964** *Present:* **Herat, J., and G. P. A. Silva, J.**

JAFFNA MUNICIPAL COUNCIL, Appellant, and

A. PERUMAIYINAR, Respondent

*S. C. 137/1962-D. C Jaffna, 873/M*

*Local authority - Imposition of* ***entertainment tax*** *-*

***Requirement of proper resolution - Entertainment Tax*** *Ordinance, ss. 2, 3, 8 (1).*

A resolution was passed in 1946 by an Urban Council to levy **entertainment tax** at 20 per cent. The Urban Council was succeeded later by a Municipal Council (appellant) which, without passing a resolution, sought to levy tax at 25 per cent.

**Held,** that a local authority is precluded by sections 2, 3, and 8 (1) of the **Entertainment Tax Ordinance from levying entertainment tax** in the absence of a proper resolution.

පටුන

පොදු පරිශීලනය සඳහා ටම් ශා. - ගාමිණී ගුණසේකර